# කාලීන ණය

කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සහ වාණිජ ඉඩම් සහ ගොඩනැගිලි මිලදී ගැනීම, වාණිජ ගොඩනැගිලි ඉදිකිරීම, දේපල සංවර්ධනය, ආයෝජන, කොන්ත්‍රාත්තු, නව ව්‍යාපාර ආරම්භ කිරීම සහ වෙනත් වාණිජ කටයුතු වැනි ප්‍රාග්ධන ක්‍රියාකාරකම් සඳහා කාලීන ණය ප්‍රදානය කෙරේ.

## විශේෂ ප්‍රතිලාභ

- තරඟකාරී පොලී අනුපාත
- නම්‍යශීලී ආපසු ගෙවීමේ සැලසුම්
- අවශ්‍ය නම්, ණය මුදල ආපසු ගෙවීම ආරම්භ කිරීම සඳහා සහන කාලයක් සලකා බැලිය හැක
- අවම ලියකියවිලි
- ලිහිල් කොන්දේසි

## යෝග්‍යතාවය

- ශක්‍යතාවයකින් යුතු ව්‍යාපාරයක් තිබිය යුතුය.
- ප්‍රධාන වශයෙන් ගණුදෙණුකරුගේ ආපසු ගෙවීමේ හැකියාවට යටත්ව පහසුකම් සලකා බලනු ලැබේ.
- ව්‍යාපාර ලියාපදිංචි සහතිකයක් තිබිය යුතුය.
- අපගේ බැංකුවේ හෝ වෙනත් ඕනෑම බැංකුවක මාස 6 ක් පුරා සතුටුදායක ලෙස පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුමක් සහිත ගණුදෙණුකරුවෙකු හෝ විභව ගණුදෙණුකරුවෙකු විය යුතුය.

## ණය මුදලේ ප්‍රමාණය

- ගණුදෙණුකරුගේ අවශ්‍යතාව, දායකත්වය, අරමුණ, ආපසු ගෙවීමේ හැකියාව සහ ණය ලබාගැනීමට ඇති සුදුසුකම් මත රඳා පවතී.

## පොලී අනුපාතය

- මහජන බැංකුවේ වෙබ් අඩවිය - www.peoplesbank.lk වෙත පිවිස තොරතුරු ලබාගත හැක

## ආපසු ගෙවීමේ කාලය

- මෙම ණය මුදල් කෙටි කාලීන, මධ්‍ය කාලීන හෝ දිගුකාලීනවශයෙන් ගෙවිය හැක
- එකඟවූ ආපසු ගෙවීමේ සැලැස්මට අනුව ණය වාරික මාසිකව, කාර්තුමය වශයෙන්, ද්වි-වාර්ෂිකව හෝ වාර්ෂිකව ගෙවීම්කල හැක.

## ගාස්තු, කොමිස්, පොලී ආදිය

- ස්ථාවර සහ විචල්‍ය පොලී අනුපාත
- හිඟ වාරික සඳහා දඩ පොලිය
- සම්මත ණය සැකසුම් ගාස්තු
- ගිවිසගත් කාලයට ප්‍රථම ණය මුදල ගෙවා අවසන් කිරීමකදී අය කරනු ලබන ණය මුදල කලින් පියවීමේ ගාස්තු
- තක්සේරු ගාස්තු (අදාල නම් පමණක්)
- නෛතික  ගාස්තු (අදාල නම් පමණක්)
- රජයේ මුද්දර ගාස්තු (අදාල නම් පමණක්)
- රක්ෂණ වාරික (අදාල නම් පමණක්)

## අයදුම් කිරීමේ ක්‍රමය

- දිවයින පුරා පිහිටි ආසන්නතම ශාඛාව හෝ සේවා මධ්‍යස්ථානය වෙත පිවිස ණය පහසුකම් සඳහා අයදුම්කල හැකිය

## නියමයන් සහ කොන්දේසි

- වත්මන් ව්‍යාපාර කාර්ය සාධනය සහ මූල්‍ය ඇගයීමට යටත්ව ණය පහසුකම් සලකා බලනු ලැබේ.
- මූල්‍ය පහසුකම් සලකා බැලීමේදී බැංකුවට පිළිගත හැකි සුරැකුම් ලබාදීම, සාමාන්‍යයෙන් ගණුදෙණු කරුවන්ගෙන් අපේක්ෂා කරනු ලැබේ.
- ණය පහසුකම් සලකා බැලීමේදී අභ්‍යන්තර බැදීම් සහ ණය තොරතුරු කාර්යාංශ බැදීම් (CRIB) පරීක්ෂා කරනු ලැබේ.
- ණය පහසුකම් සම්බන්ධ තොරතුරු, නියමයන් සහ කොන්දේසි කාලීනව වෙනස්වීම් වලට ලක් වේ. එබැවින්, නවතම තොරතුරු,නියමයන් සහ කොන්දේසි පිළිබඳ දැනුවත් වීම සඳහා ආසන්නතම ශාඛාව සම්බන්ධකර ගැනීම සුදුසුය.

## පැමිණිලි හැසිරවීමේ ක්‍රියාපටිපාටිය

- ගණුදෙණුකරුවන්ට info@peoplesbank.lk හරහා පැමිණිලි අප වෙත යොමු කල හැකිය
- අදාල ශාඛාව, ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය හෝ ප්‍රධාන කාර්යාලය වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කල හැක.
- අදාල ශාඛාව, ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය හෝ ප්‍රධාන කාර්යාලය වෙත ඇමතීම මගින්ද පැමිණිලි ඉදිරිපත් කල හැක.

## වැඩිදුර තොරතුරු

- ඇමතුම් මධ්‍යස්ථානය - 1961
- ප්‍රධාන කාර්යාලය - 0112481481